# 6 උක්ත ආඛ්‍යාත සම්බන්ධය I

උක්ත ආඛ්‍යාත සම්බන්ධය ගැන සැලකීමේ දී උක්තය හා ආඛ්‍යාතය අතර යෝග්‍යතාවක් පැවතීම අනිවාර්ය වෙයි. උක්ත පදය නිතර ම උක්ත රූපයෙන් හෙවත් ප්‍රථමා විභක්තියෙන් තිබිය යුතු වේ. උක්තයේ වචන භේදය හා පුරුෂ භේදය අනුව ආඛ්‍යාතය තිබිය යුතු ය. මේ හා සම්බන්ධ රීති රැසකි.

**පහත දැක්වෙන කරුණු කෙරෙහි අවධානය යොමු කරන්න.**

1. **උක්තය ප්‍රාණවාචී ඒකවචන නම්, ආඛ්‍යාතය ද ඒකවචන විය යුතු ය. උක්තය ප්‍රාණවාචී බහුවචන නම්, ආඛ්‍යාතය ද බහුවචන විය යුතු ය.**

   ළමයා පාඩම් කරයි.
   ළමයි පාඩම් කරති.

2. **උක්තය උත්තම පුරුෂ වේ නම් ආඛ්‍යාතය ද ඊට අනුරූප විය යුතු ය.**

   මම හොඳින් උගනිමි.
   අපි හොඳින් උගනිමු.

3. **උක්තය මධ්‍යම පුරුෂ වේ නම්, ආඛ්‍යාතය ද ඊට අනුරූප විය යුතු ය.**

   නුඹ හොඳින් ඉගෙන ගන්නෙහි ?
   නුඹලා හොඳින් ඉගෙන ගන්නෙහු.

4. **උක්තය ප්‍රථම පුරුෂ වේ නම්, ආඛ්‍යාතය ද ඊට අනුරූප විය යුතු ය.**

   ඔහු/හේ/ඕ හොඳින් ඉගෙන ගනියි.
   ඔවුහු හොඳින් ඉගෙන ගනිති. (පුරුෂ භේදය)
   ගොවියා කුඹුරේ ගොයම් කපන්නේ ය.
   ගෙවිලිය ගෙදර දවල් බත පිළියෙල කරන්නී ය.

5. **උක්තය අප්‍රාණවාචී ඒකවචන වුවත්, බහුවචන වුවත්, ආඛ්‍යාතය ඒකවචන වේ.**

   i. තාරකාව අහසේ බබළයි.
   ii. තාරකා අහසේ බබළයි.
   iii. ගස සුළඟට සෙලවෙයි.
   iv. ගස් සුළඟට සෙලවෙයි.

6. **අප්‍රාණවාචී උක්තයට "ඕ" "හු" යන ප්‍රාණවාචී ප්‍රත්‍යය යෙදූ විට, ආඛ්‍යාතය බහුවචන වේ.**

   i. තාරකාවෝ අහසේ බබළති. (තාරකා + ඕ = තාරකාවෝ )
   ii. ගස්හු සුළඟට සෙලවෙති. (ගස් + හු = ගස්හු)

7. **සමූහාර්ථවාචී පදයක් අප්‍රාණවාචී පදයක් සමඟ යෙදී උක්ත වූ විට ආඛ්‍යාතය ඒකවචන වේ.**

   **රැළ, පෙළ, කැල, මුළ, ගණ, පිරිස, රංචුව, පොකුර, කණ්ඩායම යනාදිය සමූහාර්ථවාචී පද වේ.**

i. ගස් පෙළ සුළඟට සෙලවෙයි.
ii. තරු කැල අහසේ බබළයි.

8. **සමූහාර්ථවාචී පදයක් ප්‍රාණවාචී නාමයක් සමග යෙදී උක්ත වූ විට ආඛ්‍යාතය බහුවචන වේ.**

i. ළමා පෙළ ක්‍රීඩා කරති.
ii. සියොත් කැල අහසේ සැරි සරති.
iii. බිඟු රළ මලින් මලට යති.
iv. සොර මුළ වනයේ සැරි සරති.

09. **ඇතැම් සමූහාර්ථවාචී පද ඒකකයක් ලෙස අර්ථ ප්‍රකාශනයේ යෙදෙන විට එහි ආඛ්‍යාතය ඒක වචන හෝ බහු වචන හෝ වශයෙන් තබනු ලැබේ.**

i. විරුද්ධ පක්ෂය නැඟිට යයි /යති.
ii. සාම මණ්ඩලය රැස් වෙයි / රැස්වෙති.
iii. බෞද්ධ ලෝකයා සතුටට පත් වෙයි / පත් වෙති.

10. **ආශීර්වාදයක් හෝ ප්‍රාර්ථනාර්ථයක් හඟවන ආඛ්‍යාතයක් යෙදෙන විට, උක්තය ප්‍රථමා විභක්තිය ගනී.**

i. අපක්ෂපාතී නායකයෙක් පහළ වේවා !
ii. සියලු සත්ත්වයෝ සුවපත් වෙත්වා !
iii. මම නිදුක් වෙම්වා !
iv. අපි නිදුක් වෙමුවා !
v නුඹ නිදුක් වෙහිවා !

11. **අධ්‍යාහාර වශයෙන් ආඛ්‍යාතය ගත යුතු තන්හි, උක්තය උක්ත ස්වරූපයෙන් ම යෙදේ. ආඛ්‍යාතය අධ්‍යාහාරයෙන් ගැනීම යනුවෙන් අදහස් කෙරෙන්නේ පැහැදිලි ආඛ්‍යාතයක් පෙනෙන්නට නැතත්, එම අදහසේ අඩුවක් නොමැති ව වාක්‍ය ඉදිරිපත් කිරීමයි.**

i. මෙවර දක්ෂ ක්‍රීඩකයෝ ලංකාවෙනි.
ii. අපි විනීත දරුවෝ (වෙමු).
iii. මම දක්ෂ ගුරුවරියක් (වෙමි).
iv. ඔහු ලේඛකයෙක් (වේ).
v. ඈ නිළියක් (වේ).

## නිත්‍ය බහුවචන පද

12. **නිත්‍ය බහුවචන පදයක් උක්ත වූ කල්හි ආඛ්‍යාතය ද බහුවචන වේ. අයෙක්, කෙනෙක්, සමහරෙක්, ඇතැමෙක්, අය, කවුරු, සමහරු, ඇතැම්හු යන පද නිත්‍ය බහුවචන වේ.**

i. සමහරෙක් ඉතා උනන්දුවෙන් ඉගෙන ගනිති.
ii. ඇතැමෙක් නිකරුණේ කාලය ගත කරති.
iii. කෙනෙක් එදින රැස්වීමට නො පැමිණියහ.

13. නිත්‍ය බහුවචන පද ඇතැම් විට ඒකාර්ථයක් ප්‍රකාශ කිරීම සඳහා පැහැදිලි ව යෙදීමේ දී ආඛ්‍යාතය ඒකවචන වේ.

i. එක් කෙනෙක් හොඳින් ඉගෙන ගනියි.
ii. ක්‍රීඩා කණ්ඩායමෙන් එක් අයෙක් ඉල්ලා අස් වෙයි.
iii. පන්ති කාමරයේ කිසිවෙක් නො සිටියේ ය.

14. ගෞරවාර්ථ ප්‍රත්‍ය සහිත පද උක්ත වූ කල්හි ආඛ්‍යාතය බහුවචනයෙන් යෙදේ. ගෞරවාර්ථ ප්‍රත්‍ය ලෙස සැලකෙන්නේ ආණ, අණු අණි, ආදියයි. වහන්සේ, පා, ආදි පද ද ඕ, හු ආදි ප්‍රත්‍ය ද ගෞරවාර්ථය හැඟවීම සඳහා නාම සමග යෙදේ. "වහන්සේ" සමග "සේක" "යන්න ද "දෑ" යන්න සමග "දෑ ය" යන්න ද ආඛ්‍යාතය සඳහා යෙදේ.

i. තෙරණියෝ ආරාමයට වඩිති.
ii. ස්වාමීන් වහන්සේ දම් දෙසූ සේක/ දෙසූහ.
iii. මෑණියන් දෑ අප වෙනුවෙන් වෙහෙසෙන දෑ ය/ වෙහෙසෙති.
iv පියාණෝ අපට ඔවදන් දෙති.
v. තෙර පා සමවත් සුවයෙන් වැඩ වෙසෙති.
vi. නාහිමියෝ වෙහෙරට වඩිති.
vii. ගුරුළුගෝමීහු අමාවතුර ලියූහ.

15. තෙමේ, තුමූ පද භාවිතය

"තෙමේ" යන්න පුරුෂ ලිංග ඒකවචන ද "තොමෝ" යන්න ස්ත්‍රීලිංග ඒකවචන ද වේ. "තෙමේ/තොමෝ" යන දෙකෙහි බහුවචනය "තුමූ" වේ.

i. ඒ තෙමේ ගමට ගියේ ය.
ii. ඕ තොමෝ ගමට ගියා ය.
iii. සභා තොමෝ විසිර ගියා ය.
iv. ඔවුහු තුමූ ගමට ගියහ.

16. ද්විත්ව උක්තය
ද්විත්ව උක්තයේ උක්ත දෙකක් ඇත. එක උක්තයක් ආඛ්‍යාත පූරණය ලෙස යෙදී ඇත. උක්තයෙන් කියැවෙන දෙය නැවත වරක් ප්‍රකාශ වේ නම් එය ද උක්ත ස්වරූපයෙන් තැබිය යුතු ය.

i. අපි ශ්‍රී ලාංකිකයෝ වෙමු.
ii. ළමයි පස් දෙනක් එතෙර සංචාරයක යෙදුණහ.

### 6.1 ක්‍රියාකාරකම 1

පහත දැක්වෙන වාක්‍යවල හිස්තැන් පිරවීමට යෙදිය හැකි නිවැරදි පදය වරහන් තුළින් තෝරන්න.

1. .................. දිනපතා දෙමාපියන් වැඳ පාසල් යන්නෙහි ය.
(නුඹ/නුඹලා)
2. ...................සෑම විට මිතුරන්ට උදව් උපකාර කරන්නහු. (නුඹ/නුඹලා)
3. ...................... පාසල් වාරය ආරම්භ වන තුරු නො ඉවසිල්ලෙන් බලා සිටින්නෙමු (අපි, අප, මම, මා)
4. යහපත් පුරවැසියකු වීමට .......................... ඉටා ගත්තෙමි. (මා, මම, අපි)

## 6.2 ක්‍රියාකාරකම 2

**පහත දැක්වෙන වාක්‍යවල හිස් තැන් පිරවීමට යෙදිය හැකි නිවැරදි ක්‍රියා පදය වරහන් තුළින් තෝරන්න.**

1. සිසුහු අසුන්වලින් නැගිට ගුරුතුමාට ආචාර .................... (කළහ/කරන ලදහ).
2. තරු කැල නිල් අහස් තලය අලංකාර ......................... (කරයි/කරති).
3. සිසු කැල විනීත ව පාරේ දකුණු පසින් ගමන් ...................... (කරයි/කරති).
4. සමහරු ඉතා උනන්දුවෙන් ඉගෙනීමේ කටයුතුවල නිරත...................... (වෙයි/වෙති).
5. හිරු කිරණින් පියුම්හු විකසිත ................ (වෙයි/වෙති).
6. තෙරණුවන් වහන්සේ පොහෝ දින හරබර දෙසුමක් ................. (කළ සේක/කෙළේ ය).

**පහත සඳහන් වාක්‍ය නිවැරදි කර ලියන්න.**

1. මා පමා නො වී පාසලට පැමිණෙමි.
2. ලොවට අගනා මෙහෙයක් කළ විරුවන් සැමගේ ගෞරවයට පාත්‍ර වෙති.
3. නෞකාව වේගයෙන් ඉදිරියට ඇදී ආහ.
4. ජලාශයෝ ධාරානිපාත වර්ෂාවෙන් පිරී ඉතිරී යයි.
5. තුරු පෙළ වනය අලංකාර කරති.
6. සමහරකු දිනපතා දේවස්ථානයට යති.
7. නා හිමි උදෑසන පිඬු සිඟා වඩිති.
8. එක් අයෙක් පමණක් අද නාට්‍ය සංදර්ශනය නැරඹීමට ගියහ.
9. අගමැතිතුමා නව විද්‍යාගාරය විවෘත කිරීමේ උළෙලට සහභාගි වූහ.
10. පියාණන් දරුවන් යහමඟ යවති.

## 6.3 ක්‍රියාකාරකම 3

**වරහන් තුළින් නිවැරදි වචනය තෝරා හිස් තැන් පුරවන්න.**

1. අපේ පන්තියේ ළමයින්ගෙන් ................... සංගීතය හදාරති. (ඇතැමෙක්/ඇතැමෙකු/ඇතැමුන්)
2. කුරුල්ලන්ගේ නාදයෙන් උදම් වූ වෘක්ෂලතාවෝ සුළඟේ රිද්මය අනුව නැටුම් ....................... ( දැක්වූහ/දැක්වෙති/දැක්විණි).
3. ශ්‍රී කාන්තා තොමෝ ලෝවැස්සන්ට නිති යස ඉසුරු ගෙන ......................... (දෙයි / දෙති/දෙන්නාහු ය).
4. අපේ පන්තියේ ..................... ශ්‍රමදානයට සහභාගි වෙති. (ළමයින් සියල්ලන් ම /ළමයි සියලේලෝ ම/ළමයි සියල්ලන් ම)
5. අපි නව යුවළට දිගාසිරි ....................... යි පැතුවෙමු. (ලැබේවා/ලැබෙත්වා/ලැබෙමුවා)
6. වර්තමාන ගැටලුවලට ගුරුවරු .......................... (වග කිව යුත්තෝ නො වෙති/ වග කිවයුත්තන් නො වෙති).
7 .............................. හොඳින් පාඩම් කළහ යි ගුරුතුමිය සිතුවා ය. (පන්තියේ ළමයි/පන්තියේ ළමයින්)